**සියළුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

✶ **පහත දැක්වෙන කවි, සිංදු හා ගීත ඇසුරෙන් අංක 1 සිට 5 තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

A- පරසක්වල අපෙ මහ රජ්ජුරුවෝ
තැගි කලයි කිරි පුස්සා
සරුබිම් සොයලා කම්මැලි වීලා
පැන්නුවයි කිරි පුස්සා

B- සවන් දී පෙරරාම චරිතේ අසව්
පොරණ ලක්දිව උන්නු රාවණ
ආල වී ජානකී

C- නන් සිරින් වොරැදි බරණැස්පුරයේ - තෙදයුත් උතුම් හු පාලනා - මා පිය වේ
වී එතරා සිත් සයුරා - ධනු ශිල්පෙද යුදයට නෙක - කඩු හරඹ ද
උගත්තෙමිය මම නැණයෙන් සිතුලෙද

D- දීකිරි දීකිරි ගෙනාවා දී කිරි
මිහිපිට කාටත් ගුණ දෙන දී කිරි

E- අසාලා කීවෙ වගතුග සියල්ලක්
යොදාලා නරන්නෙ බොරු බස් ඇසිල්ලක්
රවාලා කීවෙ අපහට දෝසයක්
කපාලා දෙමිය ගම මහගෙ බරට ගාතයක්

1) ලූෂන් බුලත්සිංහල මහතාගේ නාට්‍ය නිර්මාණයකට අයත් ගීතය වන්නේ,
i. A ය ii. B ය iii. C ය iv. D ය

2) පරාක්‍රම නිරිඇල්ල මහතාගේ නාට්‍ය නිර්මාණයකට අයත් ගීතය වන්නේ,
i. A ය ii. B ය iii. C ය iv. D ය

3) නූර්ති නාට්‍ය නිර්මාණයකට අයත් ගීතය වන්නේ,
i. A ය ii. B ය iii. D ය iv. E ය

4) උඩරට ශාන්තිකර්මයකට අයත් ගීතය වන්නේ,
i. B ය ii. C ය iii. D ය iv. E ය

5) එදිරිවීර සරච්චන්ද්‍රයන්ගේ නාට්‍ය නිර්මාණයකට අයත් වන ගීතය
i. A ය ii. B ය iii. C ය iv. D ය

★ **නිවැරදි පිළිතුර තෝරන්න.**

6) අභිනය යනුවෙන් අදහස් කරන්නේ,
   i. කාව්‍ය ශාස්ත්‍රයට අයත් සංකල්පයකි.
   ii. වේෂභූෂණ ආදියෙන් යුක්ත වීම.
   iii. නාට්‍ය පිටපතක් ප්‍රේක්ෂකයා වෙත ඉදිරිපත් කිරීමය.
   iv. ඉදිරියට පැමිණවීම යනුයි.

7) නර්තන කලාව සම්බන්ධ වඩාත් නිවැරදි ප්‍රකාශනය වන්නේ,
   i. නෘත්ත බටහිරින් බිහිවූ සංකල්පයකි.
   ii. නෘත්‍ය යනු අංග වික්ෂේප පමණක් ඇති ගැටුමකි.
   iii. නෘත්ත යනු භාව ප්‍රකාශනයෙන් තොර ගැටුමකි.
   iv. නෘත්‍යයෙහි සාත්වික අභිනය පමණක් ඇත.

8) නාට්‍යයක අනුෂාංගික කලා යොදා ගැනීමෙන් අපේක්ෂා කරන්නේ,
   i. රංගභූමිය විචිත්‍රවත් කරගැනීමයි.
   ii. වේදිකා මායාව ප්‍රකට කර ගැනීමයි.
   iii. නාට්‍යයකට අත්‍යවශ්‍යයෙන් ම එම කලාවන් තිබිය යුතු වීමයි.
   iv. නළු නිළියන්ට රඟපෑම පහසු කිරීමයි.

9) ආලෝක පහනක් නොවන්නේ,
   i. අල්ට්‍රා වයලට් ලාම්පු ය    ii. වර්ණ චක්‍රය
   iii. ධාරා ලෝක පහන    iv. යොමු පහන

10) නාට්‍යයකට රංගාලෝකය සැපයීමේ මූලික අරමුණක් වන්නේ,
   i. ප්‍රේක්ෂාව වැඩිකර ගැනීම.
   ii. නාට්‍යයේ ශෛලිය හුවා දැක්වීම.
   iii. අඳුර පලවා හැර වේදිකාවේ සිදුවන රංගකාර්ය දැකගැනීම සැලසීම.
   iv. වේදිකාව ප්‍රාසාංගික බව ඇතිකිරීම.

11) ප්‍රධාන අංග රචනා ප්‍රභේද දෙකකි.
   i. සත්ව අංග රචනය හා මිනිස් අංගරචනය
   ii. චරිත අංගරචනය හා මුහුණේ අංගරචනය
   iii. ඍජු අංගරචනය හා චරිතාංග අංගරචනය
   iv. වේදිකා අංගරචනය හා රූපලාවන්‍ය අංගරචනය

12) නාට්‍යයක් රංගගත කිරීම පිණිස තිබිය යුත්තේ
   i. වේදිකාවක්, කමතක්, කරළියක් හෝ සබයක්
   ii. පින්තූර රාමු වේදිකාව, කමත එරීනාව සහ කරළිය
   iii. රඟදැක්වීමට හැකි ඕනෑම ස්ථානයක්
   iv. පස්වලින් ගොඩකර තැනූ වහලයකින් යුත් බිමකි.

13) ප්‍රේක්ෂකයින්ට වටේටම සිට නැරඹිය හැකි රංගභූමිය වන්නේ,
   i. තානායම්පළ    ii. කරළිය
   iii. කමත    iv. පින්තූර රාමු වේදිකාව

14) පසුතල නිර්මාණ සම්බන්ධ සත්‍ය ප්‍රකාශනයක් නොවන්නේ,
   i. නළුකාර්ය පහසුවන ලෙස යොදා ගනී.
   ii. සරල හා සැහැල්ලු ද්‍රව්‍යයන්ගෙන් නිර්මාණය කරගනී.
   iii. නාට්‍යධර්මී නාට්‍යවල බහුලව යොදා ගනී.
   iv. නාට්‍ය දර්ශනයට උචිත පරිදි සකස්කර ගනී.

15) නාට්‍යධර්මී ශෛලියට අයත් නාට්‍යය ඇතුළත් වරණය වන්නේ
   i. හිරු නැති ලොව, හිත හොඳ අම්මණ්ඩි, කැලණි පාලම, මූදු පුත්තු
   ii. අහස්මාලිගා, මහගෙදර, බෝනිකිගෙදර, කඹය
   iii. මෝදර මෝල, දෙවැනි මහින්ද, මකරාක්ෂයා, මගුල් ප්‍රස්ථාව
   iv. පේමතෝ ජායතී සෝකෝ, මනමේ, මහාසාර, සඳකිඳුරු

★ **පහත දැක්වෙන තොරතුරු ඇසුරෙන් අංක 16 සිට 20 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

A- මහා සම්මත රජු
B- පඬුවස් දෙව් රජු
C- සංඛපාල රජු
D- විෂ්ණු දෙවියන්
E- රිද්දි බිසව්
F- සේරිමාන් රජු
G- රාහු අසුරේන්ද්‍ර
H- මහාකෝල යක්ෂයා
I- මංගර දෙවි
J- දීපංකර බුදුන්

16) සන්නියකුමේ උපත්කතාව හා සම්බන්ධ වන්නේ,
   i. A සහ G ය    ii. C සහ H ය    iii. F සහ J ය    iv. E සහ I ය

17) සූනියම් යාගයේ උපත් කතාව හා සම්බන්ධ වන්නේ,
   i. A සහ D ය    ii. B සහ H ය    iii. H සහ I ය    iv. C සහ E ය

18) කොහොඹා කංකාරියේ උපත් කතාව හා සම්බන්ධ වන්නේ,
   i. E සහ F ය    ii. C සහ J ය    iii. D සහ C ය    iv. B සහ G ය

19) මඩු ශාන්තිකර්මවල උපත් කතාව හා සම්බන්ධ වන්නේ,
   i. C සහ G ය    ii. E සහ H ය    iii. F සහ I ය    iv. B සහ A ය

20) රටයකුම ශාන්තිකර්මයේ උපත් කතාව හා සම්බන්ධ වන්නේ,
   i. F සහ I ය    ii. E සහ J ය    iii. H සහ J ය    iv. C සහ I ය

21) දික්තල කාලගෝල නාට්‍යයේ සංවාද උච්ඡාරණය කළ යුත්තේ,
   i. සාමාන්‍ය ජීවිතයේ මිනිසුන් කතාබහ කරන ආකාරයෙනි.
   ii. සොකරි නාටකයේ කවි ගායනා කරන විලාසයෙනි.
   iii. කිසියම් රිද්මයකට අනුව ශෛලිගත ස්වරූපයෙනි.
   iv. ලෝකධර්මී ශෛලියට අනුවය.

22) නොගැලපෙන සම්බන්ධතා ගොඩනගා ගැනීමෙන් ජීවන ගැටළු ඇති වන ආකාරය පෙන්වන නාට්‍ය නිර්මාණය වන්නේ,
   i. විකෘති    ii. කදා වළලු
   iii. මාෂා සහ වළහා    iv. දික්තල කාලගෝල

23) නාට්‍ය සංගීතයේ ප්‍රධානම අරමුණ විය යුත්තේ
   i. ජවනිකා දෙකක් අතර කාලය වෙනස්වීම හැඟවීම.
   ii. වේදිකාව අඳුරු කළ බව ප්‍රේක්ෂකයාට දැනුම් දීම.
   iii. නාට්‍යමය අවස්ථා තීව්‍ර කිරීමට දායක වීම.
   iv. ප්‍රේක්ෂකයන්ගේ සිත් සතන් පිනවීම.

24) ප්‍රාසාංගික කලා ගණයට අයත් වන කාණ්ඩය තෝරන්න.
   i. සංගීත සංදර්ශන, චිත්‍රපට දර්ශන, ඔපෙරා, ඉගිනළු
   ii. නර්තන ප්‍රසංග, සංගීත සංදර්ශන, ඔපෙරා, මුද්‍රානාට්‍යය
   iii. චිත්‍රපට දර්ශන, වේදිකා නාට්‍යය, මුද්‍රා නාට්‍යය, බැලේ
   iv. වේදිකා නාට්‍යය, ඔපෙරා, වීඩියෝ දර්ශන, ගීත නාට්‍යය

25) නානුමුරයේදී භාවිතා කරන රංග උපකරණ අයත් වර්ණය වන්නේ.
   i. ඉද්ද රොද්ද, වංගෙඩිය, ලන්තෑරුම, පැදුර
   ii. පනාව, කණ්නාඩිය, නානුතැටිය, කුල්ල
   iii. තෙල් කුප්පිය, නානු තැටිය පනාව, කණ්ණාඩිය
   iv. සබන් කැල්ල, වතුර බේසම, සළුව, පනාව

26) සොකරි රංග ශෛලිය හා සම්බන්ධ නොවන්නේ,
   i. සරල වෙස්මුහුණු භාවිතය
   ii. පිරිමින් පමණක් රංගනයේ යෙදීම.
   iii. අනුරූපණ මාධ්‍යයෙන් කතාවක් ඉදිරිපත් කිරීම.
   iv. රත්නපුර ආදි ප්‍රදේශවල ප්‍රචලිත වී තිබීම.

✶ **පහත දැක්වෙන වගුව ඇසුරෙන් අංක 27 සිට 31 තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

| නාට්‍යයේ නම | රචකයාගේ නම | පරිවර්තනය / අනුවර්තනය | මෙරට නිෂ්පාදනය |
|---|---|---|---|
| චරන්දාස් චෝර් | හබීම් තන්විල් | චරන්දාස් | **ක** |
| කැට් ඔන් ද හොට්ටන් රූප් | **ග** | හෙලේ නැග්ග ඩෝං පූතා | සුගතපාල ද සිල්වා |
| ද් ග්ලාස් මෙනාජරී | ටෙනසි විලියම් | **ජ** | හෙන්රි ජයසේන |
| **ට** | සොෆොක්ලිස් | බෙර හඬ | බන්දුල ජයවර්ධන |
| ද ප්‍රොපෝසල් | **ඩ** | මඟුල් ප්‍රස්තාව | එදිරිවීර සරච්චන්ද්‍ර |

27) ඉහත වගුවෙ 'ක' කොටුවට ඇතුළත් විය යුතු මෙරට නිෂ්පාදකගේ නම කුමක්ද?
   i. ජයලත් මනෝරත්න   ii. රංජිත් ධර්මකීර්ති
   iii. පරාක්‍රම නිරිඇල්ල   iv. ගුණසේන ගලප්පත්ති

28) ඉහත වගුවෙ 'ග' කොටුවට ඇතුළත් විය යුතු මුල් රචකයාගේ නම කුමක්ද?
   i. හෙන්රි ඉබ්සන්   ii. මැක්සිම්ගෝර්කි
   iii. ගාර්ෂියා ලෝකා   iv. ටෙනසි විලියම්

29) ඉහත වගුවෙ 'ජ' කොටුවට ඇතුළත් විය යුතු මෙරට නිෂ්පාදනයේ නම් කරන්න.
   i. අහස් මාලිගා   ii. වැදගත්කම
   iii. හුණුවටයේ කතාව   iv. මකරාක්ෂයා

30) ඉහත වගුවෙ 'ට' කොටුවට ඇතුළත් විය යුතු මුල් කෘතියෙ නම කුමක්ද?
   i. රූඩන්ස්   ii. ඉක්නෙව්ටාඉ

iii. සවුන්ඩ් ඔෆ් ද ඩ්‍රම් iv. යෙර්මා

31) ඉහත වගුවෙ 'ඩ' කොටුවට ඇතුළත් විය යුතු රචකයාගේ නම කුමක්ද?
i. ඇන්ටන් චෙකොව්ප්
ii. සැමුවෙල් බෙකට්
iii. නිකොලායි ගොගොල්
iv. රේකුනී

32) කෝළම් නාට්‍ය වලට අයත් ස්ථාවර පාත්‍රයෙක් නොවන්නේ,
i. මුදලි
ii. ජසලෙංචිනා
iii. ආරච්චිල
iv. පච්චමිරා

33) මේ අතරින් බෞද්ධ පූජාකර්මයක් වන්නේ,
i. ඇත්බන්ධන මී බන්ධන
ii. මරා ඉපැද්දීම
iii. ආලවක දමනය
iv. අඹ විදමන

34) රංග වින්‍යාස ශිල්පියා මූලිකවම අවධානය යොමු කළ යුතු වන්නේ,
i. රූපණ ශිල්පීන් පිළිබඳව ය.
ii. නාට්‍යයේ දෘෂ්ටිය පිළිබඳව ය.
iii. රංග ශෛලිය පිළිබඳව ය.
iv. වේදිකාවේ හිස් අවකාශය නිර්මාණශීලී ලෙස භාවිතය පිළිබඳව ය.

35) ප්‍රේක්ෂකාගාරයේ ඉදිරිපස සිට පසුපද දක්වාත් දෙකෙළවරටත් රංගනය මනාව පෙනෙන සේ ඉදිරිපත් කිරීමට වේදිකාවේ ප්‍රබලම ස්ථානය වන්නේ
i. වේදිකාවේ පසුතිර කොටස
ii. වේදිකාවේ ඉදිරි ආසන්න කොටස
iii. දෘෂ්ටි රේඛාවට මැදිවී ඇති කොටස
iv. වේදිකාවට නගින පඩිපෙල කොටස

36) චිත්‍රපට හා නාට්‍ය සම්බන්ධයෙන් වඩාත් නිවැරදි කියමන වන්නේ
i. චිත්‍රපට ප්‍රාසාංගික කලාවක් වන අතර නාට්‍ය එසේ නොවේ.
ii. චිත්‍රපට දර්ශන නියමිත වේලාවටම පටන්ගන්නා අතර නාට්‍ය එසේ නොවේ.
iii. චිත්‍රපට නළුවාට මෙන්ම නාට්‍ය නළුවාට ද තම රංගනය නැරඹිය හැකිය.
iv. චිත්‍රපටිය ප්‍රාසාංගික කලාවක් නොවන අතර නාට්‍ය ප්‍රාසාංගික කලාවක් වේ.

37) නාට්‍යවේදිනී සෝමලතා සුබසිංහ ප්‍රසිද්ධ වේදිකාවට පිවිසියේ,
i. නරිබෑනා නාට්‍යයෙනි
ii. එලොව ගිහින් මෙලොව ආවා නාට්‍යයෙනි
iii. රත්තරන් නාට්‍යයෙනි
iv. මූදු පුත්තු නාට්‍යයෙනි

38) මේ අතරින් මනමේ නාට්‍යයේ වැද්දගේ චරිතය නිරූපණය කළේ,
i. බෙන් සිරිමාන්න
ii. එඩ්මන් විජේසිංහ
iii. හෙන්රි ජයසේන
iv. ගාමිණී සමරකෝන්

39) ජයලත් මනෝරත්න විසින් නිර්මාණය කරන ලද නාට්‍ය පමණක් ඇතුළත් වරණය කුමක්ද?
i. සොක්‍රටීස්, ද්විත්ව, පුත්‍ර සමාගම, ගුරුතරුව
ii. මහගිරිදඹ, තලමල පිපිලා, අන්දරේලා, ගුරුතරුව
iii. රතුහැට්ටකාරි, තලමල පිපිලා, අන්දරේලා, ගුරුතරුව
iv. රතු හැට්ටකාරී, සොක්‍රටීස්, මෝදර මෝල, අන්දරේලා

40) ගාමිණී හත්තොට්ටුවේගම මහතාගේ නාට්‍ය පමණක් ඇතුළත් වරණය වන්නේ,
i. ලෙඩක් නැති ලෙඩෙක්, පිං පෙට්ටිය, බෝසත් දැක්ම, පෝලිම
ii. ලෝකය තනි යායක්, රජදැක්ම, රූකඩයෝ, බීජ දැක්ම
iii. පිං පෙට්ටිය, බීජ දැක්ම, පෝලිම, රූකඩයෝ
iv. කපුටු බෝ, රජකතාව, ලෝක ආහාර සම්මේලනය, වෙන්දේසිය